ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(202)
க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2024(2025)

විෂය අංකය / பாட இலக்கம்: **50**
විෂය / பாடம்: **නාට්‍ය හා රංග කලාව**

I පත්‍රය - පිළිතුරු
I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 3 | 31. | 4 |
| 02. | 3 | 12. | 3 | 22. | 2 | 32. | 3 |
| 03. | 4 | 13. | 4 | 23. | 4 | 33. | 1 |
| 04. | 3 | 14. | 1 | 24. | 1 | 34. | 1 |
| 05. | 2 | 15. | 4 | 25. | 3 | 35. | 2 |
| 06. | 4 | 16. | 2/4 | 26. | 2 | 36. | 3 |
| 07. | 2 | 17. | 2 | 27. | 4 | 37. | 4 |
| 08. | 4 | 18. | 2 | 28. | 3 | 38. | 1 |
| 09. | 1 | 19. | 3 | 29. | 4 | 39. | 2 |
| 10. | 1 | 20. | 1 | 30. | 2 | 40. | 4 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන පිටුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25 / 40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25 / 40



CamScanner

# 50 - නාට්‍ය හා රංග කලාව

## II පත්‍රය - පිළිතුරු

1. දීක්කල කාලගෝල නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) දීක්කල කාලගෝල නාට්‍යයේ සිංදු රාග තාල සහ රචනය කාගේ ද? (ලකුණු 02 යි)

(ii) මෙම නාට්‍යයේ පූර්ව රංගයේ ඇතුළත් වන චරිත දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) කාලගෝල තම බිරිඳ ලෙස දීක්කල ලබාගත්තේ කෙසේ ද? (ලකුණු 02 යි)

(iv) දීක්කල ගයන රත්දර සිරියා සරදන ....' යන සිංදුව අනුව ඇය ගේ සිතේ පවතින දුකට හේතුව කුමක් ද? (ලකුණු 02 යි)

(v) දික්පිටියා දුටු විට දීක්කල ගේ සිත ඔහු වෙත ඇදී ගියේ ඇයි? (ලකුණු 02 යි)

(vi) නාට්‍ය අවසානයේ මහොෂධ පඬිතුමා ගෝලයින්ට පවසන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(i) චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ (ලකුණු 02)

(ii) පොඩෙත් ගුරු, බනුබූන කෝලම (ලකුණු 02)

(iii) සත් වසක් කඩුව බැල මෙහෙවර කොට (ලකුණු 02)

(iv) අඟුටුමිටියකුට කසාද බන්දා දීම නිසා (ලකුණු 02)

(v) දික්පිටියා රූපයෙන් තමාට ගැලපෙන නිසා (ලකුණු 02)

(vi) අධිකරණය ඉදිරියට එන සෑම නඩුවකටම විසඳුම් නීති පොත්වල ලියා නැති බව (ලකුණු 02)

2. (i) ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

- සශ්‍රීකත්වය හා සෞභාග්‍ය උදෙසා
- සෙත් ශාන්තිය අපේක්ෂාවෙන්
- අපල උපද්‍රව දුරු කර ගැනීමට
- රෝග සමනය කර ගැනීම සඳහා
- අණවින හදි හූනියම්වලින් ආරක්ෂා වීම සඳහා
- යක්ෂ, ප්‍රේත, භූත දෝෂවලින් මිදීමට
- දරුඵල අපේක්ෂාවෙන්
- වර්ෂාව අපේක්ෂාවෙන්

**ඉහත සඳහන් කරුණු අතරින් දෙකක් සඳහන් කිරීම සඳහා (ලකුණු 02)**

(ii) උඩරට ශාන්තිකර්මයක් නම් කර, එහි ඇති අන්තර් රංග අවස්ථා තුනක් දක්වන්න. (ලකුණු 04 යි)

<u>උඩරට ශාන්තිකර්මයක් නම් කිරීමට</u> (ලකුණු 01

උදා - කොහොඹා කංකාරිය, වලියක් මංගල්‍යය, ගම්මඩුව

<u>අන්තර් රංග අවස්ථා තුනක් සඳහන් කිරීමට</u> (ලකුණු 0

ගුරුගේ මාලාව, නයා යක්කම, වැද්දන් පිවිස්සීම, සීනා යක්කම, දර්පන යක්කම, ඌරා යක්කම, ගබඩා කොල්ලය, මුව මල විදීම

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(iii) ඉහත (ii) හි සඳහන් කළ අන්තර් රංග අවස්ථා අතුරෙන් එකක් තෝරාගෙන එහි දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

අපේක්ෂකයා සඳහන් කළ අන්තර් රංග අවස්ථාවක දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ (සංවාද භාවිතය, අනුකරණය , අනුරූපණය, චරිත නිරූපණය, සිද්ධි නිරූපණය, රංග වස්තු, රංග භාණ්ඩ භාවිතය) උදාහරණ සහිතව පැහැදිලි කර තිබිය යුතු ය.

එක් නාට්‍යමය ලක්ෂණයක් උදාහරණ සහිතව පැහැදිලි කර ඇත්නම් (ලකුණු 02)
නාට්‍යමය ලක්ෂණ දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කර ඇත්නම් (ලකුණු 04)
නාට්‍යමය ලක්ෂණ තුනක් උදාහරණ සහිතව පැහැදිලි කර ඇත්නම් (ලකුණු 06)

3. (i) සොකරි රඟ දැක්වීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

සොකරි රඟ දැක්වීමේ අරමුණු

- සශ්‍රීකත්වය හා සෞභාග්‍යය උදාකර ගැනීමට
- පත්තිනි පූජාවක් ලෙස
- විනෝදාස්වාදය සඳහා
- දරු සම්පත් අපේක්ෂාවෙන්

මෙකී අරමුණු දෙකක් ලියා ඇත්නම් (ලකුණු 02)
එක් අරමුණක් පමණක් ලියා ඇත්නම් (ලකුණු 01)

(ii) සොකරි නාට්‍යයේ මූලික කතා පුවත කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

<u>සොකරි නාටකයේ මූලික කතා පුවත</u>

සොකරිය, ගුරුහාමි හා පරයා ලංකාවට පැමිණ පදිංචිවීමට තැනක් සොයන අතර තඹරාවිට නම් ගමේ වෙදරාළ ඔවුනට ඉඩම් කැබැල්ලක් දෙයි. ඔවුහු එහි ගෙයක් තනාගෙන වාසය කරති. දිනක් වතුර ගෙනෙන්නට යන ගුරුහාමි, වෙදරාළගේ බල්ලා විසින් සපා කනු ලබයි. වෙදකම් කිරීමට එන වෙදරාළ සොකරි වශීකර ගෙන පලා යයි. අවසානයේ ගුරුහාමි විසින් සොකරිය සොයාගනු ලබන අතර ඇය ඒ වන විට ගැබ්ගෙන සිටියි. දරුවා ලැබුණු පසුව සියල්ලෝම සාමදාන වෙති.

- ගුරුහාමි, සොකරි, පරයා නැව් නැගී ලංකාවට පැමිණ වෙදරාළගේ ඉඩමක පදිංචිවීම.
- ගුරුහාමිව බල්ලා විසින් සපාකෑම, වෙදරාළ පැමිණ වෙදකම් කිරීම හා සොකරි වෙදරාළ සමග පලායාම.
- තොවිලයක් කිරීමෙන් පසු ගුරුහාමි සොකරිව සොයා ගැනීම, ඇය ගැබ්ගෙන සිටීම හා දරුවා ලැබීමෙන් පසු සියල්ලෝ සාමදානවීම.

ඉහත දැක්වෙන එක සිදුවීමක් චරිත සමග ලියා ඇත්නම් (ලකුණු 01)
සිදුවීම් දෙකක් චරිත සමග ලියා ඇත්නම් (ලකුණු 02)
සිදුවීම් තුනක් චරිත සමග ලියා ඇත්නම් (ලකුණු 03)
සිදුවීම් සියල්ල සමග සම්පූර්ණ කතාව චරිත සමග ලියා ඇත්නම් (ලකුණු 04)



CamScanner

(iii) ඉහත (ii) හි සඳහන් කළ කතා පුවත රඟ දැක්වෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

- සොකරි නාටකය රඟ දක්වන්නේ කමත රංග භූමිය කොටගෙනය. රංග භූමිය මැද වංගෙඩියක් තබා ඒ මත ලන්තෑරුමක් දැල්වේ.
- නාට්‍යාරම්භයේ දෙවියන් නමැද වරම් ගැනීමෙන් අනතුරුව ගුරුන්නාන්සේ සියලුම පාත්‍රයෙන් කවි ගායනයෙන් හඳුන්වා දෙයි. එවිට නළුවෝ බෙර තාලයේ රිද්මයට අනුව නටමින් වංගෙඩිය වටා ගමන් කරති.
- කණ්ඩායම් නායකයා (ගුරුන්නාන්සේ) සිදුවීම් කවියෙන් විස්තර කරන අතර නළුවෝ අනුකරණයෙන් හා අනුරූපණය මගින් එකී සිදුවීම් රඟ දක්වති.
- කවි ගායනා අතරට හිටිවන සංවාද කොටස් යොදා ගැනේ. එම සංවාදවලින් පාත්‍රයින් කරන්නට යන්නේ කුමක් දැ යි ප්‍රේක්ෂකයාට දැන ගන්නට ලැබෙයි.
- නැවක් සෑදීමට ගසක් කැපීම, ලී ඉරීම, නැව සෑදීම ආදි සිදුවීම් නළුවෝ බෙර තාලයට අනුව රඟ දක්වති. නළුවෝ රඟපාන අතර ගුරුන්නාන්සේ එම ක්‍රියාව කවියෙන් විස්තර කරයි.
- ඒ ඒ ජවනිකාවට අවශ්‍ය පරිදි තනන ලද රංග භාණ්ඩ රඟ මඩලට ගෙනෙනු ලැබේ. නැව ගමන දැක්වීමේ දී උණ පතුරු රාමුවකට විෂ්ණු කඩදාසි අලවා සාදන ලද නැවක් නළුවෙකු විසින් රංග භූමිය වටේ තල්ලු කරගෙන යනු ලැබේ.
- වෙදරාළත්, පරයාත්, සොත්තානාත් වෙස් මුහුණු පැළඳ සිටිති. එම වෙස් මුහුණු කාඩ්බෝඩ් වලින් හෝ කොළපත් වලින් සාදාගත් ඒවාය.
- බෙරය සඳහා ගැට බෙරය යොදා ගයි. ඇතැම් පළාත් වල උඩැක්කිය වාදනය කෙරේ.

කරුණු 3ක් සඳහන් කොට පැහැදිලි කර ඇත්නම් (ලකුණු 06)
ඉහත සඳහන් එක් කරුණකට එක් ලකුණ බැගින් හිමි වේ. කරුණු 06 ලියා ඇත්නම් (ලකුණු 06)

4. (i) වර්තමානයේ නාට්‍ය රඟ දැක්වීමට වැඩි වශයෙන් භාවිත වන වේදිකා වර්ග දෙකක් නම් කරන්න.

(ලකුණු 02 යි)

1. පින්තූර රාමු වේදිකාව හෙවත් ප්‍රොසීනියම් (ආරුක්කු) වේදිකාව
2. වට රවුම් (ඇරීනා) වේදිකාව
3. අර්ධ කවාකාර එළිමහන් වේදිකාව
4. ප්‍රක්ෂේපිත වේදිකාව

එක් වේදිකා වර්ගයක් නම් කර ඇත්නම් (ලකුණු 01)
වේදිකා වර්ග දෙකක් නම් කර ඇත්නම් (ලකුණු 02)

(ii) රංග භූමිය මත රඟපෑමේ දී නළු-නිළියන් විසින් අවධානය යොමු කළ යුතු කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

1. රංග භූමියට ප්‍රවේශ වීමේ දී හා පිටවීමේ දී ඊට අදාළ දිශාවන් පිළිබඳව සැලකිලිමත් වීම.
2. නාට්‍යයේ සිදුවීම් හා රංග ක්‍රියාකාරකම්වලට උචිත පරිදි රංග භූමියේ ස්ථානගත වීම හා චලනය වීම.
3. ප්‍රේක්ෂකයන්ට මනාව පෙනෙන පරිදි රංග භූමිය මත ස්ථානගත වීම.
4. රංග භූමියේ සමබරතාව රැකගැනීම.
5. රංගාලෝකය පතිත වන ස්ථාන ගැන සැලකිලිමත් වීම.
6. රංගභූමි අලංකරණ හා නාට්‍යෝපකරණ තබා ඇති ආකාරය වටහාගෙන ඒවා නිසි පරිදි පරිහරණය කිරීම.
7. ප්‍රේක්ෂකාගාරයේ අවසාන ආසන පේළිය දක්වා ඇසෙන පරිදි හඬ ප්‍රක්ෂේපණය කිරීම.

එක් කරුණක් සඳහා (ලකුණු 01)
මෙවැනි කරුණු හතරක් සඳහා (ලකුණු 04)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

(iii) රංග භූමිය මත නළු-නිළියන් ස්ථානගත කරන විට නාට්‍ය අධ්‍යක්ෂවරයා සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

1. නාට්‍යයේ සිදුවීම් හා රංග ක්‍රියාකාරකම්වල හේතුඵල සම්බන්ධතාව රැකෙන පරිදි නළු නිළියන් ස්ථානගත කිරීම.
2. නළු නිළියන් ප්‍රේක්ෂකයාට මනාව දර්ශනය වන පරිදි ස්ථානගත කිරීම.
3. රංග භූමියේ සමබරතාවය ආරක්ෂා වන පරිදි නළු නිළියන් ස්ථානගත කිරීම.
4. රංගාලෝකය පතිතවන දිශාව හා ස්ථාන ගැන අවබෝධ කරගෙන නළු නිළියන් ස්ථානගත කිරීම.
5. නළු නිළියන් ගේ කටහඬවල් මැනෙවින් ප්‍රක්ෂේපණය වන පරිදි ස්ථාන ගත කිරීම.
6. පසුතල සැකසීම් සහ නාට්‍යෝපකරණ තබා ඇති ආකාරය සැලකිල්ලට ගැනීම.
7. නළු නිළි ප්‍රේක්ෂක සහසම්බන්ධය තහවුරුවන පරිදි ස්ථානගත කිරීම.
8. පෙළ රචනයෙහි සඳහන් රංග විධාන ගැන සැළකිලිමත් වීම.
9. දර්ශනීය ප්‍රේක්ෂාවක් මැවෙන පරිදි නළු නිළියන් ස්ථානගත කිරීම.

එක් කරුණක් සඳහන් කර විස්තර කර ඇත්නම් (ලකුණු 02)
කරුණු දෙකක් සඳහන් කර විස්තර කර ඇත්නම් (ලකුණු 04)
කරුණු තුනක් සඳහන් කර විස්තර කර ඇත්නම් (ලකුණු 06)

5. (i) 'කෙටි නාට්‍ය' යනු කුමක් දැ යි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

කෙටි නාට්‍යයක් යනු රංගන කාලයෙන් අඩු සෑම අංශයකින්ම සංක්ෂිප්ත වූ ඒකාංක නාට්‍යයයි.

රංගන කාලය අඩුවීම (ලකුණු 01)
ඒකාංක නාට්‍යයකි (ලකුණු 01)

(ii) කෙටි නාට්‍යවලට ආවේණික සුවිශේෂ ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

- එක් අංකයකින් හෝ එක් ජවනිකාවකින් යුක්තවීම.
- එක් අදහසක් හෝ එක් සංසිද්ධියක් පාදක කරගැනීම.
- සීමිත චරිත සංඛ්‍යාවක් යොදා ගැනීම.
- කාල ඒකීයත්වය, ස්ථාන ඒකීයත්වය, ක්‍රියා ඒකීයත්වය යන ත්‍රිවිධ ඒකීයත්වය බොහෝවිට දක්නට ලැබේ.
- කතාව ගලායන කාලය හා අවකාශය සීමාසහිත වීම.
- වේදිකා පසුතල දර්ශන හා නාට්‍ය උපකරණ සීමිතව යොදා ගැනීම.

එක් කරුණක් සඳහන් කර විස්තර කර ඇත්නම් (ලකුණු 01)
කරුණු දෙකක් සඳහන් කර විස්තර කර ඇත්නම් (ලකුණු 02)
කරුණු තුනක් සඳහන් කර විස්තර කර ඇත්නම් (ලකුණු 03)
කරුණු හතරක් සඳහන් කර විස්තර කර ඇත්නම් (ලකුණු 04)

(iii) කෙටි නාට්‍ය රචනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

- නිශ්චිත එක් තේමාවකට හෝ සංකල්පයකට හෝ සංසිද්ධියකට සීමා කරගැනීම.
- එක් අංකයකට පමණක් සීමා කර ගැනීම.
- අනවශ්‍ය එකදු වචනයක්, සිදුවීමක් , චරිතයක් ඇතුළත් නොවන පරිදි රචනා කිරීම.
- කතාව විකාශනයේ දී කාල ඒකීයත්වය, ස්ථාන ඒකීයත්වය හා ක්‍රියා ඒකීයත්වය ආරක්ෂා කරගැනීම.



CamScanner

- පසුතල වෙනස් කරමින් කතා පුවත අංක හෝ ජවනිකා කිහිපයකට ගලා නොයන පරිදි රචනා කිරීම.
- කතාවේ ආරම්භය විකාශනය හා අවසානය කෙටි කාලයක් තුළ නිමාවට පත්වන පරිදි රචනා කිරීම.

**කරුණු 3ක් සඳහන් කොට පැහැදිලි කර ඇත්නම් (ලකුණු 06)**

6. (i) 1970 - 1990 අතර කාලය තුළ ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ පුනර්ජීවනයට දායක වූ ප්‍රකට රංගන ශිල්පියකු හා ශිල්පිනියක නම් කරන්න. (ලකුණු 02 යි)

<u>1970 - 1990 අතර කාලයේ නාට්‍ය කලාවේ පුනර්ජීවනයට දායක වූ ප්‍රකට රංගන ශිල්පීන්</u>
හෙන්රි ජයසේන, විජේරත්න වරකාගොඩ, විජය නන්දසිරි, ශ්‍රියන්ත මෙන්ඩිස්, ගාමිණී සමරකෝන්, ඩග්ලස් රණසිංහ, ජැක්සන් ඇන්තනී, ජයලත් මනෝරත්න, නිල් අලස්, සුමින්ද සිරිසේන

<u>රංගන ශිල්පිනියන්</u>
සෝමලතා සුබසිංහ, මානෙල් ජයසේන, අනුලා බුලත්සිංහල, කෞශල්‍යා ප්‍රනාන්දු, රත්නා ලාලනී ජයකොඩි, මැණිකේ අත්තනායක, රම්‍යා වනිගසේකර, දීපානි සිල්වා, චාන්දනී සෙනවිරත්න

**රංගන ශිල්පියකු නම් කිරීමට (ලකුණු 01)**
**රංගන ශිල්පිනියක නම් කිරීමට (ලකුණු 01)**

(ii) ඉහත (i) හි නම් කරන ලද දෙදෙනා රඟපෑ නාට්‍ය දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

අපේක්ෂකයා නම් කළ නළුවා හා නිළිය රඟ පෑ නාට්‍ය දෙක බැගින් නම් කිරීම සඳහා

**එක් නාට්‍යයක් නම් කිරීමට ලකුණු 01 (ලකුණු 04)**

(iii) ඉහත (i) හි සඳහන් කළ එක් රංගන ශිල්පියකු හෝ ශිල්පිනියක රඟ පෑ චරිත, ඒවා ඇතුළත් නාට්‍ය වර්ග හා රංග ශෛලිය, ඔවුන් ගේ නිරූපණ කුශලතා හා දක්ෂතා අගය කරමින් පාසල් බිත්ති පුවත්පතකට ලිපියක් සම්පාදනය කරන්න. (ලකුණු 06 යි)

අපේක්ෂකයා සඳහන් කළ රංගන ශිල්පියා හෝ රංගන ශිල්පිනිය රඟ පෑ නාට්‍ය වර්ග (ස්වතන්ත්‍ර, අනුවර්තන, පරිවර්තන හෝ ට්‍රැජඩි, කොමඩි, ප්‍රහසන , යථාර්ථවාදී, අසම්මත නාට්‍ය හෝ වාර්තා රංග ද යන්න). නාට්‍ය ශෛලිය (නාට්‍යධර්මී හෝ ලෝකධර්මී) යන වග හා රඟ පෑ චරිතයේ ස්වරූපය සහ චරිත නිරූපණයේ දී ප්‍රකට කළ දක්ෂතා, කුශලතා (ගායන හැකියාව, නර්තන හැකියාව , අනුකරණ හැකියාව) දක්වමින් ලිපියක් ආකාරයට ලියා ඇත්නම්.

| | |
|---|---|
| **ලිපියට ශීර්ෂ පාඨයක් යෙදීම** | **(ලකුණු 01)** |
| **රඟපෑ නාට්‍ය වර්ග සඳහන් කිරීමට** | **(ලකුණු 01)** |
| **රඟපෑ චරිතය/ භූමිකාව සඳහන් කිරීමට** | **(ලකුණු 01)** |
| **නාට්‍ය ශෛලිය සඳහන් කිරීමට** | **(ලකුණු 01)** |
| **කුශලතා හා දක්ෂතා අගය කිරීමට** | **(ලකුණු 02)** |



CamScanner
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

7. පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. පැය කිහිපයක් තුළ සිදුවන සිද්ධීන් එක ස්ථානයකට සීමා වන සේ නාට්‍ය විස්තුව සකස් කළ යුතු ය.

චතුර සහ දසුන් එක ම පන්තියේ ඉගෙනුම ලබන සිසුන් දෙදෙනෙකි. චතුර නායකත්ව දක්ෂ ය. එහෙත් මුදල් ලෝභකම නිසා කිසිදු කරගැනීමට ඉදිරිපත් නො වේ. දසුන් මුග්ධ ය. අනුන් අනුකරණය කිරීමට දක්ෂයෙකි. අලුත් ගුරුතුමිය ළමා නාට්‍යයක් නිෂ්පාදනයට සූදානම් වේ. නාට්‍යයට හා රඟපෑමට කැමති සිසුන්ට පසුව සිට නාට්‍ය පුහුණුවීම්වලට එන ලෙස ගුරුතුමිය දැනුම් දුන් බව දසුන් චතුරට පවසයි.

(i) පසුබිම, කාලය, සිදුවීම හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)

- පසුබිම හා කාලය මතු කිරීම. (ලකුණු 01)
- සිදුවීම් ගොඩනැගීම. (ලකුණු 01)
- චරිත මැවීම. (ලකුණු 01)
- රංග විධාන සමග සංවාද රචනය. (ලකුණු 01)

**කරුණු හතරෙන් එක් කරුණකට ලකුණු 01 යි.**

(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)

- ගැටුමක් ඇත. (ලකුණු 01)
- ගැටුම අවස්ථාවට උචිතව තෝරාගැනීම. (ලකුණු 01)
- උචිත ගැටුම ක්‍රමිකව වර්ධනය කර ඇත. (ලකුණු 01)
- ගැටුම අවසානයකට එළඹ ඇත. (ලකුණු 01)

**කරුණු හතරෙන් එක් කරුණකට ලකුණු 01 යි.**

(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

- කුතුහලය ගොඩනැගීම. (ලකුණු 01)
- නොසිතූ පෙරළිය. (ලකුණු 01)
- නාට්‍යෝචිත බව. (ලකුණු 01)
- සම්පූර්ණ නිමාවක් සහිත අවස්ථාවක් නිර්මාණය. (ලකුණු 01)

**කරුණු හතරෙන් එක් කරුණකට ලකුණු 01 යි.**

* * *